# මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය

## අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී) තනතුර

**සූදු ක්‍රීඩා නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී) තනතුරට පත් කිරීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

අධ්‍යක්ෂ ජනරාල් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වන අතර 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරි පනතේ නියමයන් පරිදි අධිකාරියේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ මෙහෙයුම් අධීක්ෂණය සඳහා කළමනාකරණ සභාවේ සාමාන්‍ය මග පෙන්වීම සහ පාලනය යටතේ වගකීම් දරයි.

**පත්වීමේ ස්වභාවය :-**

පත්වීම පස් වසරකට (05) නොවැඩි කාල සීමාවක් සඳහා පූර්ණ කාලීන කොන්ත්‍රාත් පදනම මතවේ.

**වැටුප් පරිමාණය :-** **රු. 500,000-25,000X4-600,000**

තනතුර සඳහා සේ.අ.අ. සහ සේ.භා.අ. දායකත්වය සහ රජය විසින් අනුමත කරනලද අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

**සුදුසුකම් :-** අපේක්ෂිත අයදුම්කරුවන් පහත (1), (2) (අ) හෝ (ආ) සහ (3) ඡේදයන් හි සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් වෙතින් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි හෝ අදාළ සමීපතම ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය ලබා තිබීම.

නීතිය/ මූල්‍ය/ ආර්ථික විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගිණුම්කරණය/ නියාමන අනුකූලතාව/ අවදානම් කළමනාකරණය සහ පාලනය/ තොරතුරු කළමනාකරණය/ තොරතුරු පද්ධති/ දත්ත විශ්ලේෂණය (නියාමන හා මූල්‍ය අධීක්ෂණයට අදාළව)

**සහ**

(2) නැතහොත්,

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් වෙතින් පහත සඳහන් විෂයන්හි පශ්චාත් උපාධියක් (Masters හෝ ඉහළ)

නීතිය/ මූල්‍ය/ ආර්ථික විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගිණුම්කරණය/ නියාමන අනුකූලතාව/ අවදානම් කළමනාකරණය සහ පාලනය/ තොරතුරු කළමනාකරණය, තොරතුරු පද්ධති / දත්ත විශ්ලේෂණය (නියාමන හෝ මූල්‍ය අධීක්ෂණයට අදාළ)

**හෝ**

(ආ) පිළිගත් වෘත්තීය ආයතනයක හෝ වරලත් ආයතනයක නියාමනය, මූල්‍ය, පාලනය, කළමනාකරණය හෝ ගිණුම්කරණයට අදාළ වෘත්තීය සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

**සහ**

(3) (1) ඡේදයේ සඳහන් ප්‍රථම උපාධිය ලබාගත් දින සිට ගණනය කරනු ලබන අවම වශයෙන් වසර 20 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද, ඉන් අවම වශයෙන් වසර 10 ක් කළමනාකරණ තනතුරක විය යුතු අතර, අවම වශයෙන් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ විධායක/ඉහළ කළමනාකරණ මට්ටමේ විය යුතුය. ඒ සමගම පහත සඳහන් ක්ෂේත්‍ර එකක හෝ කිහිපයක ප්‍රදර්ශනය කළ හැකි පළපුරුද්ද තිබීම වඩාත් යෝග්‍ය වේ:

සූදු, ඔට්ටු ඇල්ලීම, මූල්‍ය සේවා හෝ වෙනත් ඉහළ අවදානම් සහිත නියාමනය කරන ලද කර්මාන්තවල නියාමන පළපුරුද්ද/ මූල්‍ය හෝ ආර්ථික නියාමනය/ බලපත්‍ර ලබා දීම සහ අනුකූලතා අධීක්ෂණය/ නීතිය ක්‍රියාත්මක කිරීම, විමර්ශනය හෝ නියාමන බලාත්මක කිරීම/ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මූල්‍ය පහසුකම් සැපයීමට එරෙහි වීම (AML/CFT)/ රාජ්‍ය අංශයේ නියාමන පරිපාලනය/ ආයතනික ස්ථාපිත කිරීම හෝ නියාමන ප්‍රතිසංස්කරණ.

**වයස :-** අපේක්ෂකයාගේ වයස අවුරුදු 40 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**තේරීමේ ක්‍රියාපටිපාටිය**

තේරීම සිදු කරනු ලබන්නේ පහත සඳහන් දෑ ඇතුළත් තරගකාරී ක්‍රියාවලියක් මගිනි:

- ලිඛිත උපායමාර්ගික යෝජනාවක් ඇගයීම * වචන 1,500කට නොඅඩු (අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය);
- ලිඛිත උපායමාර්ගික යෝජනාව මත පදනම් වූ ඉදිරිපත් කිරීම; සහ
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

* **ලිඛිත උපායමාර්ගික යෝජනාවක් පහත තේමාව කෙරෙහි අවධානය යොමු කළ යුතුය:**

- සූදු නියාමනය සහ ප්‍රතිපත්තිමය අභියෝග පිළිබඳ අවබෝධය
- අධිකාරිය ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන උපායමාර්ගික දැක්ම
- යෝජිත නියාමන, අනුකූලතා සහ බලාත්මක කිරීමේ ප්‍රවේශය
- ශක්‍යතාව, නවෝත්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ මාර්ග සිතියම
- ආයතනික අඛණ්ඩතාව, ජාත්‍යන්තර සහයෝගීතාව, අවදානම් කළමනාකරණය සහ පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය

අනුමත ලකුණු ක්‍රමයට අනුව දැඩි ලෙස කුසලතා අනුපිළිවෙල මත පත්වීම් ලබා දෙනු ලැබේ.

**අයදුම්පත්**

අයදුම්පත් සමග පහත සඳහන් දෑ:

- ජීව දත්ත පත්‍රිකාව
- අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්වල පිටපත්
- සේවා සහ පළපුරුද්ද පිළිබඳ විස්තර
- ලිඛිත උපායමාර්ගික යෝජනාව

ලියාපදිංචි තැපැලෙන්: **ලේකම්, මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, ලෝටස් පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව** වෙත හෝ **info@mo.treasury.gov.lk** යන විද්‍යුත් තැපැලට 2026 මැයි 20 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ (හෝ විද්‍යුත් තැපැල් විෂය පථය ලෙස) **"Post of Director General, Gambling Regulatory Authority"** ලෙස සඳහන් කරන්න.

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

**ලේකම්**
**මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**
**මහලේකම් කාර්යාලය, ලෝටස් පාර, කොළඹ 01,**
**ශ්‍රී ලංකාව.**
10.05.2026